සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක 09/2024

මගේ අංකය :- PPSC/ES/01/FI/02/06,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
සබරගමුව පළාත් සභා සංකීර්ණය,
නව නගරය, රත්නපුර.
2024.06.05.

01. සබරගමුව පළාත් ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මගින්,

02. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සබරගමුව) මගින්,

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ (සබරගමුව)
I ශ්‍රේණියේ නිලධාරීන් වෙත.

## සබරගමුව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම.

සබරගමුව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා සබරගමුව පළාතේ සේවයේ නියුතු ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. **තෝරා ගැනීමේ ක්‍රමය :-**

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ වසර තුන (03)ක පළපුරුද්ද සහිත නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය අනුව ලබා ඇති සුදුසුකම් මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

03. **අයදුම්කළ යුතු ආකාරය :-**

මෙම තනතුර සඳහා වූ අයදුම්පත් මීට අමුණා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාර සකස් කර ගත යුතු ය. එම අයදුම්පත් තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා මගින්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සබරගමුව) හා පළාත් ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මගින්, සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් මගින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතු ය. මෙම අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2024.06.28 වේ.

**ආර්.කේ.ඒ. සුනීතා**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

පිටපත් :-
1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව. - කාරුණික දැනගැනීමට හා අ.ක.ස.
2. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. - කාරු. දැ.ගැ.පි. හා අ.ක.ස.

ආදර්ශ අයදුම්පත

# සබරගමුව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම් කිරීම.

01. නිලධාරියාගේ නම :-

(අ) මුලකුරු සමග නම :- ……………..……………………………………………………

(ආ) සම්පූර්ණ නම :- ……………………………....…………………………………………

02. ලිපිනය :-

(අ) කාර්යාලීය :- ………………………………....……………………………………………

(ආ) පෞද්ගලික :- ………………………………....……………………………………………

03. උපන් දිනය :- 2024.06.28 දිනට වයස:- අවු: මාස: දින:

04. දුරකථන අංකය : රාජකාරි :- ……………………… පෞද්ගලික :- …………………………

05. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ,

(i) III/II පන්තියට පත්වූ දිනය :- …………………………………....

(ii) II/I පන්තියට පත්වූ දිනය :- ……………………………………….

(iii) I ශ්‍රේණියට පත්වූ දිනය :- ………………………………..……..

(තමා අදාල පන්තියට පත්වූ දින සඳහන් කළ යුතු ය.)

06. ඔබ සබරගමුව පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති දිනය :- ………………………………...

07. අධ්‍යාපන සුදුසුකම් :-

08. ලබා ඇති වෘත්තීය සහ විශේෂ සුදුසුකම් :-

09. පරිපාලන හා කළමණාකරණ මට්ටමේ තනතුරක ලබා ඇති අත්දැකීම් :-

10. විෂයට අදාලව ඉටු කර ඇති විශේෂ ක්‍රියාකාරකම් :-

11. තමන් විසින් පළකර ඇති ග්‍රන්ථ / ප්‍රකාශන :-

12. ලබා ඇති සම්මාන හා ප්‍රශංසා මොනවාද යන්න සඳහන් කරන්න.

13. මේ දක්වා දරා ඇති තනතුරු :

| | තනතුර | ආයතනය | කාල සීමාව | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| (අ) ……………………………………………………………………………………….. | | | | |
| (ආ) ………………………………………………………………………………………. | | | | |
| (ඇ) ………………………………………………………………………………………. | | | | |

14. ඔබගේ සේවා කාලය තුල කුමන හෝ අවස්ථාවක ඔබට විරුද්ධව විනයානුකූල පියවර ගෙන තිබේද?

15. අයදුම්කරන තනතුර සඳහා විශේෂයෙන් සඳහන් කළ යුතු සුදුසුකම් කිසිවක් වේ නම් ඒ ගැන තොරතුරු?

මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය                                                  අයදුම්කරුගේ අත්සන

---

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ……………………………………………………… මහතා / මහත්මිය / මෙනවිය සබරගමුව පළාත් සභාව යටතේ වන …………………………………………………………කාර්යාලයේ…………….. තනතුරක සේවය කරන බවද, 2024.06.28 දිනට පූර්වයෙන් වූ කාල සීමාව තුළ ඔහුගේ /ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවද, වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද එම කාල සීමාව තුළ කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු / ඇය භාජනය නොවූ බවද, ඔහු / ඇය මා ඉදිරිපිටදී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බවද මෙයින් සහතික කරමි.

දිනය :-

පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සබරගමුව),
පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මුවගම, රත්නපුර.

---

නිරීක්ෂණ හා නිර්දේශය

දිනය :-

ලේකම්,
සබරගමුව පළාත් ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය.

---

නිරීක්ෂණ හා නිර්දේශය

දිනය :-

ප්‍රධාන ලේකම්,
සබරගමුව පළාත් සභාව.

---